# තනි පද-13

වචන කිහිපයක් වචනුවට වයදිය හැකි තනි වචන තනි පද නම් වේ .

උදා :- අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

| | | | |
|---|---|---|---|
| 241) | වනයේ ගස් එකට ඇතිල්ලී ඉබේ හට ගන්නා ගින්න | - | ලැව්ගින්න |
| 242) | කරන ලද උපකාරයට උපකාර කිරීම | - | ප්‍රත්‍යුපකාර |
| 243) | ගොවිතැනින් ජීවත් වන්නා | - | ගොවියා |
| 244) | බොහෝ ශක්තිමත් තැනැත්තා | - | යෝධයා |
| 245) | රජු වාඩි වෙන ආසනය | - | සිංහාසනය |
| 246) | යුද්ධයට යන තැනැත්තා | - | සෙබළා |
| 247) | කියවීමට පොත් තබා ඇති තැන | - | පුස්තකාලය |
| 248) | කෙනෙකුට පරම්පරාවෙන් ලැබෙන අයිතිය | - | උරුමය |
| 249) | ගවයන් බලා ගන්නා තැනැත්තා | - | ගොපල්ලා |
| 250) | ආහාර ගැනීමට බොහෝ ආශා කරන | - | කෑදර |
| 251) | රටින් රට සංචාරය කිරීම | - | දේශාටනය |
| 252) | පා සතරක් ඇති | - | සිවුපා |
| 253) | බඩ ගා යන සතුන් | - | උරගයන් |
| 254) | කෙනෙකුට සතුටින් දෙන දෙය | - | තෑග්ග |
| 255) | වස්තුව බොහෝ ඇති | - | ධනවත් |
| 256) | වනයට ගොස් සතුන් මැරීම | - | දඩයම |
| 257) | එක් ඇසක් නොපෙනෙන | - | කණා |
| 258) | සතුන් බලා ගන්නා | - | එඬේරා |
| 259) | සතුන් පිට බඩු පටවා ගෙන යන පිරිස | - | තවලම |
| 260) | සිනහ උපදවන | - | හාස්‍යජනක |